# සුව ජාතකය

තවද මාගේ මුදුන්මල්කඩවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෑවාවූ අන්නපානාදිය දිරවාගතනොහි මළාවූ භික්ෂූකෙණෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේදැයි යත්

එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේ සයදන නොවළඳා අජ්ණීකොට වළඳා මළසේක, මේ කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහනසේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් තෘෂ්ණාවසඟව මළෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාල සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන්ගේ හිමාලවනයෙහි ගිරාව ඉපද වායෝවෘද්ධව දැස් නැතිව වාසය කරන්නාහ. බෝධිසත්වයන්ගේ පුතනුකෙණෙක් ඇත්තාහ. ඒ පුතනුයෝ දෙමව්පියන්ට පලාඑල ගෙණවිත්ලා රකිනාහ. එසමයෙහි ඒ ගිරා පොතකයෝ සමුද්‍ර මධ්‍යයෙහි මී අඹ ඇති නියාව දැන පසු දවස් සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනට ගොස් අඹකා දෙමව්පියන්ට අඹ ගෙණවුත් දුන්නුය. බෝධිසත්වයෝත් එකියන අඹ කා මේ අඹ අසවල් දිවයිනේ අඹගසේමයයි කිවුය. එවිට බෝධිසත්වයන්ගේ පුතනුවෝත් ඒ අඹයයි කිවුය. ඊට බෝධිසත්වයෝ කියන්නෝ පුත ඒ දිවයිනින් අඹ ගෙනීමෙන් ඉදිරියේ බොහෝ උපද්‍රව පැමිණෙයි. එසේ හෙයින් දිවයිනට ගොස් අඹ කන්නේමය. එක් දවසක් අඹ කා මත්ව පියා නිදිකන ඇතිව පියා අඹන්නේ මංහසර දැනගතනොහි මහමුහුද මැද පියාසර කොට දියේ වැටී මළහ. ඒ මළාවූ ගිරාපෝතකයා මත්ස්‍යයෝ ගසා කෑවාහ. බෝධිසත්වයෝ තමන්ගේ පුතනුවන් නොආහෙයින් මා කීවානොඅසා මළමැනවයි සිතා තමන්ට ගොදුරුැලන කෙනෙකුන් නැති හෙයින් තල්ල වියලී මළාහයි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් යම්සේ කීවා නොඅසා තෘෂ්ණාවාසභව ඒ ගිරවා මළද එමෙන් යම්කෙණෙක් තෘෂ්ණාවසඟව ඒ ගිරවා මළද එමෙන් යම්කෙණෙක් තෘෂ්ණාවසඟව අන්නපාන බොහෝ කොට කත්නම් උන්ටත් එසේම වන්නේයයි යම් කෙනෙක් තමන්ගේ අග්නි විවරට අන්නපාන කන්නම් දෙලොවින් සුවඑලවයි වදාරා මේ සුව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි එකියන ගිරාපෝතකයා නම් මේ කියන භික්ෂූහුය. ගිරවාට පියව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.